සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## දෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 6 - 2017

**නම : ...............................................** **ඉස්ලාම් ධර්මය** **කාලය : පැය 2යි.**

**සැලකිය යුතුයි:**

❖ පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

## I කොටස

❖ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

❖ නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

(1) මුස්ලිම් අයෙකු සලාතය ඉටු කිරීමට ආරම්භ කළයුතු වයස.

(i) 15 (ii) 6 (iii) 10 (iv) 7

(2) එක් මුස්ලිම්වරයෙකු අල්ලාහ් සමඟ ඉතා සමීපව සංවාදයේ යෙදෙන අවස්ථාව.

(i) සලාතයේ දී (ii) උපවාසයේ දී (iii) අදානයේ (iv) සකාත කිරීමේදී

(3) මුස්ලිම් වන අයෙකු කුෆ්ර් වලින් වෙන් කර පෙන්වන ක්‍රියාවලින් එකකි.

(i) දික්ර් (ii) සව්ම් (iii) සලාත් (iv) හජ්

(4) සලාතයේ ෆර්ල් සංඛ්‍යාව.

(i) 6 (ii) 10 (iii) 2 (iv) 19 වේ

(5) ඉස්ලාමීය මාස අතුරින් උපවාසය කීවෙනි මාසය ද?

(i) 5 (ii) 7 (iii) 9 (iv) 12

(6) අල්ලාහ්ගෙන් පසු උපකාරය කළ යුතු අය

(i) පුතා (ii) මලා ඉකාවරයා (iii) දෙමවුපියන් (iv) භාර්යයාව

(7) නබිතුමා හට කැමති, සහ අවසන් දිනයේ ඔහුට ආසන්නව අසුන් ගැනීමට හැකිවන අයුරින් වන ක්‍රියාව

(i) සලාතය (ii) සකාත් (iii) සත්‍යය (iv) යහපත්

(8) මිහ්රාජ් හිදී මාංශ කමින් නියපොත්තෙන් සිය මුහුණ පපුව සූරන ලද මිනිසා කළ පව කුමක් ද?

(i) ගණිකා වෘත්තිය (ii) සොරකම් කිරීම (iii) කේලාම් කීම (iv) පොළිය ලබාගත් අය

(9) දිනපතා යෙදෙන සලාතයේ ඇතුළත් වන රක අත් සංඛ්‍යාව

(i) 05 (ii) 15 (iii) 17 (iv) 12

(10) එක් මුස්ලිම්වරයෙකු ගේ ගුණාංගයක් නොවන්නේ,

(i) සලාම් කීම (ii) ගරු කිරීම (iii) සිනාසීම (iv) ඊර්ශ්‍යා කිරීම

(11) මක්කාවේ සිට සිය ගෙවල් දොරවල් කැප කරගෙන ආ පිරිස.

(i) අන්සාරි වරු (ii) මුර්තද් (iii) මුහාජිර් වරු (iv) මුහාජිරින්වරු

(12) අප පිළිපදින ක්‍රියා දිනපතා සටහන් කර ගැනීම සඳහා භාරව සිටින මලාඉකාවරු

(i) මුන්කර් - නකීර් (ii) රිල්වාන් - මාලික් (iii) රකීබ් - අතීද් (iv) ඉස්රාෆීල් - ඉස්රායීල්

(13) මුස්ලිම් අයෙකු වීම සලාතයේ

(i) ෂර්ත් වේ (ii) ෆර්ල් වේ (iii) සුන්නත් වේ (iv) මුබ්තිලාත් වේ

(14) නබිතුමාට වහී පහළ වූ කාලය

(i) අවුරුදු 40 (ii) අවුරුදු 63 (iii) අවුරුදු 10 (iv) අවුරුදු 23

(15) ''අළුයම'' යන වචනයට අයත් අරාබි වචනය.

(i) අල්ෆලක් (ii) අල්ෆලද් (iii) අන්නාස් (iv) අල් කව්සර්

❖ **පහත සඳහන් වැකි නිවැරදි නම් ( ✔ ) ලෙස ද වැරදි නම් ( ✘ ) ලෙස ද සටහන් කරන්න.**

(16) අනුමැතිය අයදින්නේ 3 වතාවකි. ( )

(17) නබි වරුන්ගේ දේපළ ලෙස රත්තරන් සහ රිදී තිබේ. ( )

(18) ''වුලූ'' හි ෆර්ල් වූ අවයවයන් 6ක් වේ. ( )

(19) ආරම්භක තක්බීරය පැවසීම ''ෆර්ල්'' වේ. ( )

(20) උපවාසයේ ෆර්ල් සංඛ්‍යාව 6 ක් වේ. ( )

(ලකුණු 1 x 40 = 40 )

## II කොටස

❖ **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(01) (i) උපවාසයේ ප්‍රධාන ම අරමුණ සඳහන් කරන්න.

(ii) උපවාසයේ වැදගත්කම සඳහන් වී තිබෙන අල්කුර්ආන් වැකියක් ලියන්න.

(iii) සූරා ඉහ්ලාස් හි වෙනත් නම් දෙකක් සඳහන් කරන්න.

(iv) අල් කුර්ආනයේ තිබෙන සූරා සංඛ්‍යාව කොපමණ ද?

(v) ප්‍රථමයෙන් පහළ වූ සූරා, කීවැනි පරිච්ඡේදයේ සඳහන් වේ ද?

(vi) නිවසකට ඇතුළු වීමට අනුමැතිය ලබන්නට අවශ්‍ය කොන්දේසි කීය ද?

(vii) දෙමවුපියන්ගේ තෘප්තිය කිනම් අයගේ තෘප්තිය වේ ද?

(viii) ''මුබ්තිලාන්'' යනු කුමක් ද?

(ix) මුහුදු ජලය අපවිත්‍ර කිරීමේ ක්‍රියාව කුමක් ද?

(x) ''සමදා සියළුම අංගයන් අල්ලාහ් - ට බියවන්න.'' නුඹ තුළමයි අපගේ කිලය පතිත වන්නේ යනුවෙන් පැවසූ අවයවය කුමක් ද? (ලකුණු 2 x 10 = 20)

(02) සලාතයෙහි මුබ්තිලාත් 5 ක් ලියන්න. (ලකුණු 10)

(03) (i) දෙමවුපියන් හට කළයුතු යුතුකම් 5 ක් ලියන්න.

(ii) දෙමවුපියන් වෙනුවෙන් දරුවන් අයදින දුආ කුර්ආනය කෙසේ උගන්වයි ද? (ලකුණු 10)

(04) නබි (සල්) තුමා කේලාම්, අපහාස යනාදිය පිළිබඳව සහාබාවරුන් හට පැහැදිළි කළ හදීස් කෙසේ පැහැදිලි වන්නේ ද? (ලකුණු 10)

(05) (1) පහත සඳහන් අරාබි වචනවල අර්ථය පැහැදිලි කරන්න.

(i) කිරාඅත්තුල් කුර්ආන් (ii) සජ්දා

(iii) කලාමුල්ලාහ් (iv) කුත්තාබුල් වහී

(2) අල්කුර්ආනය පාරායනය කිරීමේ දී පිළිපැදිය යුතු කරුණු 6 ක් ලියන්න.

(ලකුණු 10)

(06) (i) සුරතුල් ෆීල් පහළ වූ හේතුව කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) ඇත් හමුදාව විනාශ කළ පක්ෂි කණ්ඩායමේ නම කුමක් ද?

(iii) ඇත් වර්ෂය අරාබියෙන් කෙසේ හඳුන්වනු ලැබේ ද? (ලකුණු 10)

(07) (i) මිනිසා වෙනුවෙන් පහළ වූ පොදු මාර්ගෝපදේශනය කුමක් ද?

(ii) වහී පහළ වූ කන්දේ නම කුමක් ද?

(iii) වහී පහළ වූ විට නබිතුමාගේ වයස කීය ද?

(iv) අල් කුර්ආනය වෙනුවෙන් යෙදී තිබෙන නම් 2 ක් ලියන්න. (ලකුණු 10)

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 6 - 2017

### ඉස්ලාම් ධර්මය පිළිතුරු පත්‍රය

## I කොටස

(1) - 7
(2) - සලාතය
(3) - සලාත්
(4) - 19
(5) - 9
(6) - දෙමවුපියන්
(7) - යහගුණ
(8) - පොළිය ලබාගත් අය
(9) - 17
(10) - ඊර්ෂ්‍යා කිරීම
(11) මුහාජිරීන්වරු
(12) රකීබ්, අතීද්
(13) ෆර්ල්
(14) අවු.23.
(15) අල් ෆලක්
(16) ✓
(17) x
(18) x
(19) ✓
(20) x

(ලකුණු 2 x 20 = 40 )

## II කොටස

(01) (i) දේව භය ඇතිවීම.
(ii) ඔබලාට පෙර සිටි අය හට උපවාසය අනිවාර්ය වුවා මෙන්ම ඔබට ද උපවාසය අනිවාර්ය වී ඇත. එ මගින් ඔබ දේව බය ඇති අය ලෙස වෙනස් විය යුතුයි. (2:183)
(iii) සුරතුල් අහද් සුරතුල් තෞහීද්
(iv) 114
(v) 96
(vi) 3, i. ඇතුල්වීමට පෙර සලාම් කීම.
ii 3 වතාවක් අනුවැකිය අයදීම.
iii ඕනෑකමින් බලා නොසිටීම.
(vii) අල්ලාහ්ගේ තෘප්තිය.
(viii) බිඳෙන්නට හැක.
(ix) අන් අයට දොස් පැවසීම.
(x) දිව ආරක්ෂා කිරීම.

(02) සලාතයේ මුබ්තිලාත් 10 අතරින් 5 ක් ලියා තිබේ නම් ලකුණු ලබා දෙන්න.

(03) (i) වගකීම් 5 ක් ලියා තිබේ නම් (ලකුණු 5)
(ii) රබ්බිර්හම් හුමා කමාරබ්බයානි සඝීරා
(ලකුණු 5)

(04) කේලම් ඃ ඔබගේ සහෝදරයා ප්‍රතික්ෂ්ප කරන ක්‍රියාව කේලම් කීම වේ.
අපහාස ඃ නුඹ කියන ක්‍රියාව ඔහු ළඟ නැතිනම් එය අපහාසයක් වේ. (මුස්ලිම්) (ලකුණු - 10)

(05) (i) කිරාඅතුල් කුර්ආන්ඃ අල්කුර්ආන් පාරායනා කරන ක්‍රම.
(ii) සජ්දා ඃ හිස පහත් කළ යුතු තැන්වල සජ්දා කිරීම.
(iii) කලාමුල්ලාහ් ඃ අල්ලාහ් ගේ කියමන
(iv) කුත්තාබුල් වහී - වහී සටහන් කිරීමට භාරකාරත්වය ලද අය.

(06) (i) ඉතිහාසය කෙටියෙන් ලිවීම.
(ii) අබාබීල් පක්ෂීන්.
(iii) ආමුල් ෆීල්.

(07) (i) අල්කුර්ආන්.
(ii) ජබලුන් නූර්.
(iii) අවුරුදු 40.
(iv) ෆුර්කාන්, අල් කිතාබ්,